සියලුම හිමිකම් ඇවිරිණි/ முழுப் பதிப்புரிமையுடையது / All Rights reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
வடமேல் மாகாணக் கல்வித் திணைக்களம்
Provincial Department of Education - NWP

11 ශ්‍රේණිය | වර්ෂ අවසාන පරීක්ෂණය - 2023(2024) | 62 S I,II

නම: .........................................

# පුරවැසි අධ්‍යාපනය I කොටස

කාලය පැය තුනයි

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.
- 1 සිට 40 තෙක් ප්‍රශ්නවල දී ඇති 1, 2, 3, 4 පිළිතුරු වලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන පිළිතුර තෝරන්න.
- ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට ගැළපෙන කවය තුළ (x) ලකුණ යොදන්න.

1. ප්‍රජාතන්ත්‍රවාදී රටක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව කටයුතු කිරීම නිසා
   1. නීතියේ රැකවරණය පාලකයින්ට හිමි වේ.
   2. නීතියේ රැකවරණය සියලුදෙනාටම සමානව ලැබේ.
   3. පාලකයින්ගේ අත්තනෝමතික ක්‍රියා අඩු වේ.
   4. පුරවැසි අයිතිවාසිකම් පිළිබඳව පාලක පන්තිය දැනුවත් වේ.

2. රටක විරුද්ධ පක්ෂයේ කාර්ය භාරයක් වන්නේ මින් කුමක්ද?
   1. ආණ්ඩුව සිදුකරන සියලු ක්‍රියා අනුමත කිරීම.
   2. ආණ්ඩු පක්ෂය නිතර විවේචනයට ලක් කිරීම.
   3. ආණ්ඩුව විසින් ක්‍රියාවට නංවන සියලු ප්‍රතිපත්ති වලට සහයෝගය දැක්වීම.
   4. පවත්නා ආණ්ඩුවට වඩා යහපත් විකල්ප ආණ්ඩුවක් පිහිටුවීමට කටයුතු කිරීම.

3. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක අයිතිවාසිකම් ලබා දීමේ අවසාන අරමුණ වන්නේ,
   1. පුද්ගල සංවර්ධනය තුළින් සමාජයේ අභිවෘද්ධිය ඇති කිරීමයි.
   2. අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම් ඉටු කිරීමයි.
   3. පුද්ගලයාට තම ජීවිතය පරිපූර්ණ කර ගැනීමට සැලැස්වීමයි.
   4. සෑම අයෙකුටම සමාන අවස්ථා ලබාදීමයි.

4. 'ප්‍රීතිමත් හා ගෞරවාන්විත ජීවිතයක් ගත කිරීමේ අරමුණින් මිනිසුන් එකට එක් වී පිහිටුවා ගත් සංවිධානය රාජ්‍ය ලෙස නිර්වචනය කළේ,
   1. මහාචාර්ය ගානර් විසිනි. 2. ටී. එච්. ග්‍රීන් විසිනි. 3. ඇරිස්ටෝටල් විසිනි. 4. ප්ලේටෝ විසිනි.

5. කිසිදු අභ්‍යන්තර හෝ බාහිර බලවේගයක මැදිහත්වීමෙන් තොරව ජනතාව වෙනුවෙන් යෙදවිය හැකි බලය වන්නේ,
   1. පරමාධිපත්‍ය බලයයි. 2. පරිපාලන බලයයි. 3. ස්වාධිපත්‍ය බලයයි. 4. දේශපාලන බලයයි.

6. මධ්‍යම ආණ්ඩුව සතු ත්‍රිවිධ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් ප්‍රාදේශීය ආණ්ඩු ඒකක වෙත පවරා දීම හඳුන්වන්නේ,
   1. බලය විමධ්‍යගත කිරීම යනුවෙනි. 2. බලය බෙදාහැරීම යනුවෙනි.
   3. බලය පැවරීම යනුවෙනි. 4. බලය විහැන් කිරීම යනුවෙනි.

7. ලංකාවේ පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව අතර සම්බන්ධීකරණ කටයුතු සිදු කරනු ලබන්නේ කවුරුන් විසින්ද?
   1. මහ ඇමති විසිනි. 2. ජනාධිපති විසිනි. 3. ඇමතිවරු විසිනි. 4. ආණ්ඩුකාරවරයා විසිනි.

8. මධ්‍යම ආණ්ඩුවට අමතරව ප්‍රාන්ත 50 ක් පවතින, ව්‍යවස්ථාදායකය කොංග්‍රස් මණ්ඩලය නමින් හඳුන්වන රට කුමක්ද?
   1. ඇමෙරිකා එක්සත් ජනපදය 2. ස්විස්ටර්ලන්තය 3. ඉන්දියාව 4. ඕස්ට්‍රේලියාව

9. ඕනෑම රටක සමාජ සාධාරණත්වය බිඳ වැටීමට බලපාන හේතුවක් වන්නේ,
   1. අවශ්‍ය ආකාරයට බලය විමධ්‍යගත වීම.
   2. රාජ්‍ය පාලනයේ කාර්යක්ෂමභාවය
   3. නිලධාරිවාදය ඉස්මතු වීම.
   4. රාජ්‍ය සේවය නිර් දේශපාලනීකරණය වීම.

10. වර්තමානයේ බහු සංස්කෘතික රාජ්‍යයන්ගේ තේමාව වන්නේ,
1. 'එක් ජාතියකට එක් රාජ්‍යයක්' යන්නයි.
2. 'වෙනස්කම් තුළින් එකමුතු බව' යන්නයි.
3. 'සංස්කෘතික අනන්‍යතාවයට ගරු කිරීම' යන්නයි.
4. 'සාමූහිකත්වය වර්ධනය කිරීම' යන්නයි.

11. සංස්කෘතිය සම්බන්ධයෙන් නිර්වචන ඉදිරිපත් කළ චින්තකයින් ඇතුලත් පිළිතුර තෝරන්න.
1. ටී. බී. ටයිලර් හා සීලර්
2. හර්මන් ජේ ෆයිනර් සහ ඇරිස්ටෝටල්
3. චාර්ල්ස් ඒ එල්වුඩ් සහ ජේ. ආර්. ලොවෙල්
4. ටී. බී. ටයිලර් සහ චාර්ල්ස් ඒ එල්වුඩ්

12. නිෂ්පාදනය කළ යුතු භාණ්ඩය කොපමණ නිෂ්පාදනය කරන්නේද යන ප්‍රශ්ණය විසඳාගැනීමෙන් පසුව නිෂ්පාදකයාට ඊළගට මුහුණදීමට සිදු වන ආර්ථික ප්‍රශ්නය වන්නේ,
1. කවුරුන් සඳහා නිෂ්පාදනය කරන්නේද යන්නයි.
2. කෙසේ නිෂ්පානය කරන්නේද යන්නයි.
3. කුමක් නිෂ්පාදනය කරන්නේද යන්නයි.
4. නිෂ්පාදනය කරන්නේ කුමන අංශයෙන්ද යන්නයි.

13. පුද්ගල අවශ්‍යතා හා වුවමනා ඉටුකර ගැනීම සඳහා යොදාගන්නා භාණ්ඩ හා සේවා
1. පාරිභෝගික භාණ්ඩ ලෙස හඳුන්වයි.
2. අන්තර් භාණ්ඩ ලෙස හඳුන්වයි.
3. ප්‍රාග්ධන භාණ්ඩ ලෙස හඳුන්වයි.
4. ආයෝජන භාණ්ඩ ලෙස හඳුන්වයි.

14. ශ්‍රී ලංකාවේ දක්නට ඇති වෙළඳ පොල අර්ථ ක්‍රමයේ ලක්ෂණයක් වන්නේ,
1. පෞද්ගලික අංශය දිරි ගැන්වීම යි.
2. විදේශ වෙළදාම සම්බන්ධයෙන් බාධා ඇති කිරීම යි.
3. විනිමය පාලන කටයුතු රාජ්‍ය අංශයෙන් සිදු කිරීම යි.
4. රුපියලේ විදේශ අගය රාජ්‍ය අංශයෙන් තීරණය කිරීම යි.

15. තිරසාර සංවර්ධයේ දී සැලකිය යුතු කරුණක් වන්නේ මින් කුමක්ද?
1. මූලික අවශ්‍යතා පිළිබඳ අඩු අවධානයක් යොමු කිරීම.
2. අනාගත පරම්පරාව සමඟ ඒකමතික නොවීමට කටයුතු කිරීම.
3. පරිසරය පිළිබඳ නොසලකා හැරීම.
4. සමාජ සුරක්ෂිතතාව ඇති කිරීම.

16. දකුණු ආසියානු වරණාත්මක වෙළෙඳ ගිවිසුමට (SAPTA) අයත් සාමාජික රටක් වන්නේ මින් කුමක්ද?
1. ප්‍රංශය
2. බ්‍රිතාන්‍ය
3. පකිස්ථානය
4. කැනඩාව

17. සාර්ව ගැටුමක් වන්නේ,
1. පුද්ගලයා තුළ ඇති වන ගැටුම්
2. පවුල් අතර ඇති වන ගැටුම්
3. රටවල් අතර ඇති වන ගැටුම්
4. පුද්ගලයින් අතර ඇති වන ගැටුම්

18. ගැටුම් සාමකාමීව විසඳා ගැනීමේ වාසියක් වන්නේ,
1. දේශපාලන අස්ථාවරත්වයක් ඇතිවීම.
2. ජාතික ඒකාබද්ධතාවය ඇති වීම.
3. මානසික ආතතිය උග්‍ර වීම.
4. ආර්ථිකය බිඳ වැටීම.

19. පහත දැක්වෙන ආරවුල් අතරින් 'බේරුම් කිරීම' යොදා ගත හැකි අවස්ථා දැක්වෙන පිළිතුර තෝරන්න.
A. මුදල් පිළිබඳ ආරවුල්
B. පවුල් ආරවුල්
C. සේවක ගැටුම්
D. විනය පරීක්ෂණ
E. පෞද්ගලික ගැටුම්

1. ABC
2. BCD
3. CDE
4. ACD

20. පහත සඳහන් ප්‍රකාශ අතරින් නීතිය සම්බන්ධයෙන් අසත්‍ය ප්‍රකාශය තෝරන්න.
1. නීතිය නොදැන සිටීම නිදහසට කරුණකි.
2. ලංකාවේ ක්‍රියාත්මක වන්නේ රෝම ලන්දේසි නීතියයි.
3. රටක සියලු ජනතාව නීතියට යටත්ය.
4. නීතිය හා බැඳුනු අනෙක් සංකල්පය වන්නේ යුක්තියයි.

21. අධිකරණ සේවා කොමිසන් සභාව සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය වන්නේ,
1. අධිකරණයේ ස්වාධීනත්වය ඇති කිරීමට පිහිට වූ ආයතනයකි.
2. සාමාජිකයන් පස් දෙනෙකුගෙන් යුක්ත වේ.
3. එහි සාමාජිකයන් පත් කරනු ලබන්නේ නීතිපතිවරයාය.
4. එහි ධූර කාලය වසර හතරකි.

22. ශ්‍රී ලංකාවේ ඉහළ අධිකරණ ආයතන වලට විනිශ්චයකාරවරුන් පත් කරනු ලබන්නේ,
   1. අග්‍රවිනිශ්චයකාරතුමා විසිනි.
   2. නීතිපතිතුමා විසිනි.
   3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමැතියට යටත්ව ජනාධිපති විසිනි.
   4. ජනාධිපතිගේ උපදෙස් මත අධිකරණ ඇමති විසිනි.

23. පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් සමාජයට එරෙහිව කරන ලද වැරදි සම්බන්ධයෙන් ශ්‍රී ලංකාව තුළ බලාපන නීතිය හඳුන්වන්නේ,
   1. අපරාධ නීතිය යනුවෙනි.
   2. සිවිල් නීතිය යනුවෙනි.
   3. මූලික නීතිය යනුවෙනි.
   4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතිය යනුවෙනි.

24. ශ්‍රී ලංකාව ස්වාධීන ස්වෛරී ජන රජයක් බවට පත් වූයේ කුමන වර්ෂයකදීද?
   1. 1833 දී  2. 1948 දී  3. 1972 දී  4. 1978 දී

25. 1931 ඩොනමෝර් ආණ්ඩු ප්‍රතිසංස්කරණය යටතේ මෙරට පිහිටු ව්‍යවස්ථාදායකය හැඳින් වූ නිල නාමය වන්නේ,
   1. පාර්ලිමේන්තුව නමිනි.
   2. ජාතික රාජ්‍ය සභාව නමිනි.
   3. සෙනෙට් සභාව නමිනි.
   4. රාජ්‍ය මන්ත්‍රණ සභාව නමිනි.

පහත සඳහන් ප්‍රකාශ අදාල කරගෙන 26 සහ 27 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න.
   A. නීති පැනවීම.
   B. රාජ්‍ය සේවය පාලනය කිරීම.
   C. විදේශ කටයුතු
   D. පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.
   E. රාජ්‍ය මූල්‍ය පාලනය
   F. විධායකය පාලනය
   G. ජනතාවගේ දුක් ගැනවිලි ඉදිරිපත් කිරීම.

26. ශ්‍රී ලංකාවේ ව්‍යවස්ථාදායකයට අයත් කාර්යයන් ඇතුලත් වන පිළිතුර තෝරන්න.
   1. ABC  2. BCD  3. CEG  4. AFG

27. විධායකයට අයත් කාර්යයන් ඇතුලත් වන පිළිතුර තෝරන්න.
   1. ACD  2. BCE  3. CDE  4. DEF

28. ප්‍රාදේශීය සභා සම්බන්ධයෙන් නිවැරදි ප්‍රකාශය තෝරන්න.
   1. ලංකාවේ ජනගහනයෙන් වැඩි ප්‍රමාණයක් ජීවත් වන්නේ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ තුලය.
   2. 1978 අංක 15 දරන පනත මගින් පිහිටුවා ඇත.
   3. සෑම ප්‍රාදේශීය සභාවක්ම දිස්ත්‍රික්කයකට සීමා වේ.
   4. ප්‍රාදේශීය සභාවල ප්‍රධානියා වන්නේ නාගරික කොමසාරිස්ය.

29. ශ්‍රී ලංකාවේ වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව මූලික අයිතිවාසිකම් කඩ වූ විට ගත හැකි ක්‍රියා මාර්ග දක්වා ඇත්තේ කුමන වගන්තිය මගින්ද?
   1. 156 වන වගන්තියේය.  2. 162 වන වගන්තියේය.  3. 126 වන වගන්තියේය.  4. 152 වන වගන්තියේය.

30. ළමා අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකාව ගෙන ඇති ක්‍රියාමාර්ගයක් වන්නේ,
   1. ළමයින් සම්බන්ධව බලය පොලිසියට භාර දීම.
   2. ළමයින්ට අවශ්‍ය නිදහස උපරිම ලෙස ලබාදීම.
   3. අධ්‍යාපනය නොමිලේ ලබාදීම.
   4. සෑම අවස්ථාවකදීම ළමයාගේ උපරිම යහපත වෙනුවෙන් කටයුතු කිරීම

31. වැඩකරන ජනතාව උදෙසා සමාජ සාධාරණත්වය ඉටු කිරීම අරමුණු කරගෙන පිහිටුවා ඇති සංවිධානය වන්නේ,
   1. ලංකා කම්කරු සංවිධානය
   2. අන්තර් ජාතික කම්කරු සංවිධානය
   3. අන්තර් ජාතික මානව හිමිකම් සංවිධානය
   4. අන්තර් ජාතික රතු කුරුස සංවිධානය

32. ශ්‍රී ලංකාවේ කාන්තා ප්‍රඥප්තිය සකස් කර ඇත්තේ කිනම් වර්ෂයකද?
   1. 1981 දී  2. 1993 දී.  3. 1979 දී  4. 1999 දී

33. පාරිසරික ගැටළු අවම කර ගැනීම සඳහා රටක ජනතාවට ගත හැකි ක්‍රියා මාර්ගයක් වන්නේ,
   1. ස්වාභාවික වනාන්තර එළිපෙහෙළි කර වගා කටයුතු ආරම්භ කිරීම.
   2. අධි පරිභෝජනයට හැකිතාක් යොමු වීම.
   3. කසල වර්ගීකරණය කර ක්‍රමානුකූලව බැහැර කිරීම
   4. පෘතුවියේ ඇති ඛනිජ ද්‍රව්‍ය සෙවීමට යොමුවීම.

34. සංවර්ධිත රටවල දක්නට ලැබෙන ලක්ෂණ ඇතුලත් පිළිතුර තෝරන්න.
   A. නාගරික ජන සංඛ්‍යාව වැඩිවීම.
   B. විදේශ විනිමය හිඟවීම
   C. ප්‍රාග්ධන සම්පත් වැඩිවීම
   D. නිෂ්පාදන අඩුවීම

   1. A හා B    2. C හා D    3. A හා D    4. A හා C

35. සංවර්ධනය වන රටක් ලෙස ශ්‍රී ලංකාව තුළ දක්නට ලැබෙන විශේෂ ලක්ෂණයක් වන්නේ,
   1. ළදරු මරණ අනුපාතිකය පහළ මට්ටමක පැවතීම.
   2. ආයු අපේක්ෂාව පහළ මට්ටමක පැවතීම.
   3. දේශපාලන ස්ථාවරත්වයක් පැවතීම.
   4. දේශීය ඉතුරුම් දිරි ගැන්වීම.

36. වායු දූෂණය මගින් ඇති වන අහිතකර ප්‍රතිඵලයක් නොවන්නේ,
   1. වර්ෂණ ක්‍රියාවලිය වෙනස්වීම
   2. හිම කඳු දියවීම.
   3. දූවිලි වලා ඇතිවීම.
   4. මුහුදු ජල මට්ටම ඉහළ යාම.

37. ආසියානු කලාපය සංවර්ධනය කිරීමේ අරමුණින් 'ආසියන්' සංවිධානය පිහිටුවා ගත්තේ,
   1. 1987 දීය.    2. 1985 දීය    3. 1967 දීය    4. 1950 දීය.

38. දේශ සීමා සාධකය පදනම් කරගෙන වර්තමානයේ ගැටුම් නිර්මාණය වී ඇති රාජ්‍යයක් වන්නේ,
   1. ඇමෙරිකා එක්සත් ජනපදය    2. ඊශ්‍රායලය    3. රුවන්ඩාව    4. ඉන්දියාව

39. එක්සත් ජාතීන්ගේ ආරක්ෂක මණ්ඩලයේ නිත්‍ය සාමාජික රටවල් දැක්වෙන පිළිතුර තෝරන්න.
   1. චීනය, ඉන්දියාව, බ්‍රිතාන්‍ය, ප්‍රංශය, රුසියාව
   2. ජර්මනිය, ප්‍රංශය, ඇමෙරිකාව, ඉන්දියාව, චීනය
   3. ප්‍රංශය, බ්‍රිතාන්‍ය, ජර්මනිය, ඇමෙරිකාව, චීනය
   4. ප්‍රංශය, රුසියාව, බ්‍රිතාන්‍ය, ඇමෙරිකාව, චීනය

40. රාජ්‍යයන් අතර සාමකාමී සම්බන්ධතා පවත්වාගෙන යන ප්‍රධාන මාධ්‍යය වන්නේ,
   1. තානාපති සේවයයි.
   2. විදේශ කටයුතු අමාත්‍යංශයයි.
   3. මහ ලේකම් කාර්යාලයයි.
   4. ජාත්‍යන්තර සංවිධානයි.

## II කොටස

- පළමු ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමු ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න හතරක් ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.**

01. i. රාජ්‍ය සතුවන අත්‍යාවශ්‍ය ලක්ෂණ දෙකක් ලියන්න.
ii. ජනාධිපති ආණ්ඩු ක්‍රමයක් තුළ දැකිය හැකි විශේෂ ලක්ෂණ 2ක් ලියන්න.
iii. ස්විස්ටර්ලන්තයේ මධ්‍යම ආණ්ඩුව සතු වන බලතල දෙකක් සඳහන් කරන්න.
iv. යහ පාලනයක දැකිය හැකි මූලික ගුණාංග දෙකක් ලියන්න.
v. ඕනෑම ආර්ථිකයක සිදුවන ක්‍රියාවලීන් දෙකක් නම් කරන්න.
vi. අන්තර් ජාතික ගැටුම් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.
vii. නීතිය ක්‍රියාවට නංවන ප්‍රධානීන් දෙදෙනෙකු නම් කරන්න.
viii. මානව අයිතිවාසිකම් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න.
ix. රටක සංවර්ධනය මැනීමේ පරමාර්ථයන් 2ක් නම් කරන්න.
x. පොදු රාජ්‍ය මණ්ඩලයේ ආරම්භක සාමාජික රටවල් 2ක් නම් කරන්න. (ල : 2x10-20)

02. "නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යටතේ පුරවැසියන්ට ඍජුවම පාලන කටයුතුවලට සහභාගී වීමට ඇති ඉඩ කඩ සීමා වේ".
i. පාලන ක්‍රමයක් ලෙස ඍජු ප්‍රජාතන්ත්‍රවාදය වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතුවන ගැටලු දෙකක් ලියන්න. (ල : 02)
ii. ප්‍රජාතන්ත්‍රවාදී සමාජයක පැවැත්ම සඳහා නිදහස් ජන මාධ්‍ය මඟින් ඉටු කළ යුතු කාර්යයන් තුනක් සඳහන් කරන්න. (ල : 03)
iii. (a) ලෝකයේ පවතින පාලන ක්‍රම අතර ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය වැදගත් වීමට බලපාන හේතු 3ක් ලියන්න. (ල : 03)
(b) ඉහත සඳහන් කළ එක් ක්‍රමයක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ල : 02)

03. " මිනිස් වුවමනා ඉටුකර ගැනීමේදී විවිධ භාණ්ඩ හා සේවා යොදාගනු ලැබේ."
i. මිනිසුන්ගේ වුවමනාවන් ඉටුකර ගැනීමේදී යොදාගනු ලබන භාණ්ඩ ප්‍රධාන කොටස් දෙකකි. එම කොටස් දෙක නම් කරන්න. (ල : 02)
ii. නිෂ්පාදනය කරන භාණ්ඩ ප්‍රයෝජනයට ගන්නා ආකාරය අනුව බෙදිය හැකි කොටස් තුන ලියන්න. (ල:03)
iii. (a) මූලික ආර්ථික ප්‍රශ්න විසඳීම සඳහා වර්තමානයේ රටවල් විසින් යොදාගන්නා අර්ථ ක්‍රම 2 ක් නම් කරන්න. (ල : 02)
(b) ඉන් එක් ක්‍රමයක් පිළිබඳ විස්තර කරන්න. (ල : 03)

04. " රටක උත්තරීතර නීතිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා නීතියයි."
i. නීතියේ ආධිපත්‍යයට බලපාන ගුණාංග දෙකක් ලියන්න. (ල : 02)
ii. ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන විශේෂ නීති වර්ග තුන නම් කරන්න. (ල : 03)
iii. (a) නීතිය ක්‍රියාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකාවේ පිහිටුවා ඇති අධිකරණ ආයතන දෙකක් නම් කරන්න. (ල : 02)
(b) ඉන් එක් අධිකරණ ආයතනයක් පිළිබඳව විස්තර කරන්න. (ල : 03)

05. " මිනිස් ජීවිත වල පැවැත්ම හා ගරුත්වය ආරක්ෂා වීම සඳහා මානව අයිතිවාසිකම් අත්‍යාවශ්‍ය වේ."
i. ලෝකයේ මිනිස් අයිතිවාසිකම් බිහිසුණු ලෙස උල්ලංඝනය වූ අවස්ථා දෙක ලියන්න. (ල : 02)
ii. එක්සත් ජාතීන් ළමා අයිතිවාසිකම් සම්මුතිය සකස් කිරීමේදී පදනම් කර ගත් අරමුණු 3 ක් ලියන්න. (ල : 03)
iii. (a) අයිතිවාසිකම් හා බැඳුණු පුරවැසි යුතුකම් බෙදා දැක්විය හැකි කොටස් දෙක නම් කරන්න. (ල : 02)
(b) ඉන් එක් යුතුකම් වර්ගයක් පිළිබඳව කෙටියෙන් විස්තර කරන්න. (ල : 03)

06. "පරිසරය යනු ජීවීන්ගේ පැවැත්ම සඳහා බලපෑම් එල්ල කරන බාහිර තත්වයන්ගේ සංකලනයකි."
i. පරිසරය සකස් වී ඇති ජෛව සංරචක දෙකක් නම් කරන්න. (ල : 02)
ii. මිනිසාගේ ක්‍රියාකාරීත්වය සංකීර්ණ වීම නිසා සමාජ පරිසරය තුළ ඇති වී තිබෙන අයහපත් තත්වයන් 3 ක් ලියන්න. (ල : 03)
iii. (a) රටක ජීවත්වන පුරවැසියන් තම රටෙහි පරිසරය ආරක්ෂා කර ගැනීමට ඔවුන් විසින් ඉටු කළ යුතු යුතුකම් හා වගකීම් 2ක් ලියන්න. (ල : 02)
(b) ඉන් එක් කරුණක් පිළිබඳ විස්තර කරන්න. (ල : 03)

07. ''ජාත්‍යන්තර සබඳතා යනු ජාතීන් අතර පවත්නා සියලුම ආකාරයේ සබඳතාවන්ය.''

i. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ අරමුණු 2ක් ලියන්න. (ල : 02)

ii. වර්තමානයේ ජාත්‍යන්තර සබඳතා වර්ධනය වීමට බලපාන සාධක 3 ක් ලියන්න. (ල : 03)

iii. (a) ජාත්‍යන්තර සබඳතා වලදී ප්‍රබල රාජ්‍යයන් විසින් ශ්‍රී ලංකාවට බලපෑම් එල්ල කරන ක්ෂේත්‍ර 3ක් සඳහන් කරන්න. (ල : 03)

(b) ඉන් එක් ක්ෂේත්‍රයක් පිළිබඳ විස්තර කරන්න. (ල : 02)